**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 17 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි ගිණුමේ වර්ෂයේ එකතුවීම් ලෙස රු. 2,223,205 ක මුදලක් හරකර තිබුණද ගෙවීම් වවුචර් අනුව එහි වටිනාකම රු. 2,423,205 ක් වීමෙන් ගොඩනැගිලි වටිනාකම රු. 200,000 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා පවත්වා තිබූ ලේඛන හා ලිපිගොනු අනුව රු. 2,795,212 ක මුදලක් වැයකර තිබූ නමුත් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණේ රු. 1,282,638 ක් පමණි. ඒ අනුවශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලිරු. 1,512,574 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනටපළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු දායක මුදල් රු 452,553 ක දායක මුදල් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබූ අතර එහි ඇතුළත් වර්ෂයට අදාල වියදම රු. 28,402 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම, සභාව විසින් පවත්වා තිබූ මුද්දර ගාස්තු ලේඛනය සහ ලිපිගොනුව අනුව රු. 749,058 ක් වුවද ලෙජර් ගිණුමේ ආරම්භක ශේෂය රු. 422,880 ක් ලෙස රු. 326,178 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2012 වර්ෂයට අදාල උසාවි දඩ මුදල් ආදායම ලෙස ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබූ වැඩිපුර ආදායම කපා හැරීම වෙනුවෙන් රු. 1,126,647 ක් සමුච්චිත අරමුදල හරකර උසාවි දඩ පාලන ගිණුම බැරකළ යුතු වුවත් ජර්නල් සටහන් අංක 19 න් රු. 1,435,996 ක මුදලක් උක්ත ගිණුම් වලට හර හා බැර කර තිබුණි. ඒ අනුව රු. 309,349 ක් වැඩියෙන් එම ගිණුම්වලට ගලපා තිබුණි.

(ඊ) කඩකුලී ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු කඩකාමර කුලී ආදායම (5.20) රු. 380,226 ක් වුවද ශේෂ පත්‍රයේ එය රු. 452,825 ක් ලෙසරු. 72,599 ක් වැඩියෙන් ආදායම් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(උ) ජර්නල් සටහන් අංක 14 අනුව අන්තර් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 5,649,650 ක මුදලක් ණයහිමියන් ලෙස වෙන්කර තිබුණද, ශේෂ පත්‍රයේ එය දක්වා තිබුණේ රු. 5,469,446 ක් ලෙස රු. 180,204 ක් අඩුවෙනි.

(ඌ) කර්මාන්ත ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,477,022 ක් වූ කර්මාන්ත 5 ක් සඳහා ගෙවීම් කර නොතිබූ අතර ඒ සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

--------------------

පළාත් ණය හා සංවර්ධන අරමුදලින් සභාවට අයත් මාර්ග සංවර්ධනය සඳහා ලබාදෙන ලද රු. 14,774,321 ක් වූ ණය මුදල වෙනුවෙන් 2013 වසරට ගෙවිය යුතු රු. 2,256,180 ක් වූ වාරික 04 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2012 වර්ෂයේ iv වන කාර්තුව සඳහා ගෙවිය යුතු වාරිකය වූ රු. 564,045 න් රු. 350,000 ක් අවසන් වරට ගෙවා තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු. 13,533,848 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

එකතුවරු. 11,896,661ක්වූගනුදෙනුසම්බන්ධව ශේෂ සහතික , ලේඛන හා උපලේඛන පිළිබඳ සාක්ෂි විගණනයටඉදිරිපත් නොකෙරිනි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,077,966 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,661,866 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 310 | 205 | 86 |
| ii. | බදුකුලී | 12,696 | 9,252 | 463 |
| iii. | බලපත්‍ර ගාස්තු | 515 | 624 | 257 |
| iv. | වෙනත් ආදායම් | 13,257 | 13,562 | 1,681 |

### 2.2.2 කඩකුලී

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත් , පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01(2) දරන චක්‍රලේඛය ප්‍රකාරව තක්සේරු වටිනාකම පදනම් කරගෙන සියළුම කඩකාමර සඳහා කුලී මුදල් තීරණය කළයුතු බව දක්වා තිබුණද , සභාව විසින් පොදු වෙළඳ පොළ කඩකාමර සඳහා එවැනි තක්සේරු කිරීමක් කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ (06) ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර 05 කට වරක් තක්සේරුගත මුදල නව තක්සේරුවක් මඟින් සංශෝධනය කළයුතු බව දක්වා තිබුණද , දෙබොක්කාව කඩකාමර 04 සඳහා 2007 මාර්තු 20 දින තක්සේරුගත මුදලම 2013 දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන තිබුණි.

(ඇ) සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළයුතු වුවත් , එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුළිය රු. 452,825 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර එම හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයක් වන අල්මමාලි හෝටලයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 හා 2013 වර්ෂ වලට අයවිය යුතු රු. 82,367 ක හිඟයද ඇතුළුව 2013 දෙසැම්බර් 31 දිනට හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ලෙස එකතුව රු. 256,657 ක මුදලක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 හා 150 (4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2013 පෙබරවාරි සිට ජූනි 14 දින දක්වා ලේකම් තනතුරේ වැඩබලන ලද විශ්‍රාමිකයෙකුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 හි 02 (vi) විධිවිධාන වලට පටහැනිව රු. 15,232 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) 2009 වර්ෂයේසිට 2013 වර්ෂය අවසානය දක්වා සභාව විසින් රැස්කර තිබූ රු. 512,274 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල් 2014 ජුනි 20 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**3.2 අවිධිමත් ගණුදෙනු**

**-------------------**

(අ) සභාවට අයත් බුද්ධි මන්දිරය (පුරහල) ඉදිකිරීම් කටයුතු බාහිර සංවිධානයක් මගින් සිදුකර තිබූ අතර ජල හා විදුලි බිල්පත් පියවීම් පිළිබඳව විධිමත් එකගතාවයකට පත්වී නොතිබුණ ද රු. 45,916 ක් ජල හා විදුලි බිල්පත් සඳහා සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ) 2013 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු. 738,376 ක වීථි පහන් උපකරණ බාහිර ආයතනයකින් මිළදී ගෙන තිබුණි. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ට පටහැනිව මිළ ගණන් කැඳවීමකින් තොරව ,2011 හා 2012 වර්ෂවලදී ලබාගත් මිළගණන් පදනම් කරගෙන මෙම ද්‍රව්‍ය මිළදීගෙන තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**(අ) නිශ්ක්‍රීය වත්කම්**

**------------------**

සභාවට අයත් අංක 53 – 5713 දරන කැබ් රථය හා එන්ජින් රහිත අත්ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) හඳුනාගත් අලාභ**

**-------------------**

රු. 92,000 ක් වටිනා අංක K 80 990097 දරන ට්‍රැක්ටර් එන්ජිම 2000 අගෝස්තු 31 හෝ ඊට ආසන්න දිනක අස්ථානගත වී තිබුණ නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103 (1) , 104, 110 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය